ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# අධ්‍යක්ෂ/ ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (කොන්ත්‍රාත් පදනම මත)

## 1.0 රැකියාව/වගකීම්:

ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01හි පිහිටි නවීන පහසුකම්වලින් යුක්ත වූ සුවිසල් කාර්යාල සංකීර්ණය, රාජගිරියේ පිහිටි පුහුණු මධ්‍යස්ථානය, ප්‍රාදේශීය කාර්යාල හයක් සහ වෙනත් පරිශ්‍ර කිහිපයකින් යුතු ව ක්‍රියාත්මක වන අතර, පුද්ගලයන්, මුදල්, උපකරණ හා ගොඩනැඟිලි ආරක්ෂා කිරීම සඳහා වූ නවීන හා විශේෂිත ආරක්ෂක උපකරණවලින් සමන්විත වන ආයතනයකි.

ආරක්ෂක සේවා අධ්‍යක්ෂ පහත සඳහන් කාර්යයන් ද ඇතුළත්ව බැංකුව තුළ සියලු ආරක්ෂක වැඩපිළිවෙළ සඳහා වගකිව යුතු වන අතර, ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපති මඟින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට වාර්තා කළ යුතු වේ.

- මහ බැංකුවට අයත් විවිධ පරිශ්‍ර හා ඒ අවට වටපිටාව තුළ ආරක්ෂක වැඩපිළිවෙළ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- සියලුම ආරක්ෂක තර්ජන පිළිබඳ ව පරීක්ෂාකාරී වීම සහ එවැනි තර්ජන වැළැක්වීම හා ඊට එරෙහිව ක්‍රියා කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සහ ඵලදායී ලෙස ප්‍රතිඋපායන් යෙදීම පිළිබඳ ව බැංකු කළමනාකාරිත්වයට උපදෙස් දීම.
- ආරක්ෂක පාලක මැදිරියේ ඇති නවීන ඉලෙක්ට්‍රොනික උපකරණ හා ගිනි ආරක්ෂණ උපකරණ පාලනය කිරීම.
- බුද්ධිමය තොරතුරු රැස් කිරීම, මුර සංචාරය, ස්ථානීය ආරක්ෂක රාජකාරි, ගිනි අවි, ලෝහ හා පුපුරණ ද්‍රව්‍ය අනාවරකයන්, ගමන් මළු හා තැපැල පරීක්ෂා කිරීම සඳහා වන එක්ස් - කිරණ උපකරණ භාවිතය පිළිබඳ ව සහ වාහන, පුද්ගලයින්, ලිපි, පාර්සල් හා වෙනත් උපකරණ, පුපුරණ හා හානිදායක භාණ්ඩ සොයා පරීක්ෂා කිරීම පිළිබඳ ව මහ බැංකුවේ ආරක්ෂක නිලධාරීන් පුහුණු කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂාව පිළිබඳ ව කළමනාකාරීත්වය විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි ඉටුකිරීම.

ආරක්ෂක සේවා අධ්‍යක්ෂ, හමුදාව, පොලිසිය සහ අනෙකුත් බුද්ධි අංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ අධිකාරී බලැති තනතුරු හොබවන නිලධාරීන් සමඟ පහසුවෙන් සම්බන්ධීකරණය කළ හැකි උද්‍යෝගී හා ක්‍රියාශීලී අයෙක් විය යුතු අතර, නායකත්ව කුසලතාවලින් හෙබි විනය නීති පවත්වා ගනිමින් විශාල ආරක්ෂක සේවා පිරිසක් අභිප්‍රේරණය හා පාලනය කිරීමට හැකි වන පරිදි, තම සේවකයින්ගේ ගෞරවයට ලක්වන අයෙක් විය යුතු ය. තෝරා ගනු ලබන අයදුම්කරු දේශීය හා විදේශීය සන්නද්ධ හමුදා, රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ මූල්‍ය ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු මනා ලෙස සිදු කළ යුතු බැවින් ඔහු විශිෂ්ට සන්නිවේදන කුසලතාවලින් හෙබි අයෙකු විය යුතු ය.

එමෙන්ම, ආරක්ෂක සේවා අධ්‍යක්ෂගේ සේවාව, සති අන්තයේ සහ නිවාඩු දිනයන් ද ඇතුළත් ව, අඛණ්ඩ ව පැය 24 පුරා ලබා ගැනීමට නියමිත බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයට පහසුවෙන් ළඟා විය හැකි වන පරිදි ඔහුගේ පදිංචිය කොළඹ හෝ ඒ අවට විය යුතු ය.

## 2.0 අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද:

ආරක්ෂාව සම්බන්ධ ව දීර්ඝ හා ඵලදායී පුහුණුවකින් සහ අත්දැකීම්වලින් යුතු, අවම වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදා නිත්‍ය සේවාවේ **විශ්‍රාමික මේජර් ජෙනරාල්වරයෙකු**, ශ්‍රී ලංකා නාවික හමුදාවේ **විශ්‍රාමික රියර් අද්මිරාල්වරයෙකු** හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ **විශ්‍රාමික එයාර් වයිස් මාර්ෂල්වරයෙකු** ලෙස සේවය කළ අයෙකු විය යුතු ය.

හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු, සිවිල් පරිසරයක් සහිත ආයතනයක ආරක්ෂක සේවා කළමනාකාරණය කිරීම පිළිබඳ පළපුරුද්දක් තිබීම, අමතර සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

## 3.0 වයස:

2025.02.28 දිනට වයස අවුරුදු 58ට අඩු විය යුතු ය.

## 4.0 සේවානියුක්තිය:

**ආරම්භයේ දී වසරක කාලයක්** සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන අතර, එම කාලය අවසානයේදී අදාළ නිලධාරියාගේ සතුටුදායක කාර්යසාධනය මත තවදුරටත් සේවා ගිවිසුම දීර්ඝ කිරීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ අභිමතය පරිදි සේවා ගිවිසුම අවසන් කිරීම හෝ සළකා බැලෙනු ඇත.

## 5.0 වැටුප සහ වෙනත් ප්‍රතිලාභ:

සියලු දීමනා ඇතුළත් ස්ථිර මාසික දීමනාවක් සහ සේවක අර්ථ සාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය (සාකච්ඡා මඟින් එකඟතාවයට පැමිණිය හැකි ය.)

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මඟින් තෝරා ගැනෙනු ඇත.

## අයදුම්පත්

**අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය, https://www.cbsl.gov.lk/en/careers යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.**

නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර, අවශ්‍ය සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.02.28 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය.

අයදුම්පත් එවීමේ දී "**අධ්‍යක්ෂ/ ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා අයදුම් පත්‍රය**" යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අයදුම්පත් බාර ගන්නා දිනට පසු ලැබෙන අයදුම්පත් සහ නියමිත ආකෘතිපත්‍රයෙන් බැහැර අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සහතිකපත් පරීක්ෂාවේ දී අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සේ සලකනු නොලැබේ.**

**තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.**

බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. සම්මුඛ පරීක්ෂණ/ය සඳහා කැඳවීමේ දී අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික සුදුසුකම්වලින් ආවරණය වන විෂයය ක්ෂේත්‍රයන්හි අදාළබව සහ බැංකුවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ඔවුන්ගේ සේවා පළපුරුද්දෙහි අදාළබව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

බඳවාගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා කැඳවනු ලැබේ.


අධ්‍යක්ෂ – මානව සම්පත්
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථනය : 011-2477330 ෆැක්ස් : 011-2477715